**ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව.

(ආ) මෙම වාර්තාවේ 1.6.2(අ) හා (ආ) ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ අගය රු. 1,579,055,053 ක් ලෙස දක්වා තිබුණ ද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම අගය රු. 1,576,746,739 ක් පමණක් වූයෙන් රු. 2,308,314 ක වෙනසක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාරය අනුව ශේෂයන් සමාන විය යුතුය. | නිවැරදි කිරීම් සඳහා භාණ්ඩාගාරය වෙත දන්වා ඇත. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ භෞතික වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු. 166,450 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් විකිණීමෙන් ලද මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම්ගත කළයුතුය**.** | ලබන වසරේ ගිණුම්වල නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු. 2,533,523 ක පොලී මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ලද පොලී මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම්ගත කළයුතුය. | ලබන වසරේ ගිණුම්වල නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරමි. |

**1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වේ. එසේම, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන විමසුම පරිදි ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, මෙම වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම ප්‍රමාද වී තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | - එම - |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.1 ඡේදය. | ආයතන ප්‍රධානීන් ඇතුලුව සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවත්, වවුනියා දිස්ත්‍රික් ලේකම්වරයා කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සටහන් නොකරන බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය | වෙනත් දිස්ත්‍රික්ක වලද දිසාපතිවරුන් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 266-1-1-0-2103/11 වැය විෂය සඳහා සළසා තිබූ රු. 1,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | අවශ්‍යතා නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | ජාතික අයවැය චක්‍රලේඛ 04/2019 හා 05/2019 අනුව ඉතිරි කිරීම් සිදුකර ඇත. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදනඋපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික සමඟිය හා සංහිදියා කාර්යාංශයේ ප්‍රතිපාදන වලින් රු. 4,130,000 ක් වැය කර වවුනියා උතුර ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ 2017 දෙසැම්බර් 27 දින ඉදි කර අවසන් කර තිබුණු පළතුරු සැකසීමේ මධ්‍යස්ථානය සඳහා 2018 දෙසැම්බර් 31 දින රු. 8,096,000 ක වියදමින් යන්ත්‍ර උපකරණ මිලදී ගෙන තිබුණු අතර 2020 ජුනි 30 දින වන විටත් එම ගොඩනැඟිල්ල සහ යන්ත්‍ර උපකරණ පළතුරු සැකසීමේ කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | ගොඩනැගිල්ල පළතුරු සැකසීමේ කර්මාන්තය සඳහා යොදා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිගෙන ඇත. ගොඩනැගිල්ල වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, ඉදිරිපත්කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය. | | චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. | අමාත්‍යාංශය විසින් එවන ලද අකෘති පත්‍රය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. |
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනයේ සංවිධාන ව්‍යුහය යාවත්කාලීන නොකිරීම. | සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනයේ සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කළ යුතුය. | ඉදිරියේදී විගණන විමසුම පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට පියවර ගනිමි. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සමාලෝචනය නොකිරීම. | අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සමාලෝචනය කළ යුතුය. | - එම - |
| (ඇ) | වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතාවය අනුව වූ ක්‍රියාකාරී සැලැස්මක් සකස් නොකිරීම. | වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතාවය අනුව වූ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. | - එම - |
| (ඈ) | ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල ළඟා කර ගැනීම දක්වා නොතිබීම. | ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල ළඟා කර ගැනීම දැක්විය යුතුය. | - එම - |
| (ඉ) | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම සකස් නොකිරීම. | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම සකස් කළ යුතුය. | - එම - |

## 3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වවුනියාව උතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම් කටයුතු වලින් කොටසක් 2019 වර්ෂය තුළ අදියර දෙකක් යටතේ සිදුකර තිබුණ අතර, විගණනය සිදුකළ 2019 ඔක්තෝබර් 30 දින වන විට රු. 1,946,738 ක් වූ පළමු අදියරේ වැඩ නිම කර තිබුණි. රු. 5,135,600 ක් වූ දෙවන අදියරේ වැඩ සිදු කරමින් පැවති අතර, මෙ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ. | | |
| (අ) මෙම ගොඩනැගිල්ලේ සමස්ථ ඉදිකිරීම් සඳහා සමස්ථ පිරිවැය ඇතුළත් වන එක් ඉංජිනේරු ඇස්තමේන්තුවක් හා ගොඩනැගිල්ල සඳහා එක් සැළැස්මක් (Building design including Lay out, Structural drawings, Services, Finishing schedules etc.) පිළියෙල කර නොතිබුණි. | ඉදිකිරීම් සඳහා අවශ්‍ය සියලුම මූලික සැලසුම් විධිමත්ව සකස් කළ යුතුය. | අවශ්‍ය මානව සම්පත් බඳවා ගැනීමෙන් පසු නිවැරදි කරමි. |
| (ආ) මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු එක් අදියරක් යටතේ සිදු නොකර අදියර දෙකක් යටතේ සිදු කිරීම හේතුවෙන් දෙවන අදියර ඉදිකිරීමේ මූලික වියදම් වශයෙන් රු. 150,000 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | රාජ්‍ය මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිත්වයකින් යුතුව උපයෝජනය කළ යුතුය. | ප්‍රතිපාදන අදියර දෙකකදී ලැබුණ නිසා දෙවරකදී ප්‍රසම්පාදනයන් කරන ලදි. |
| (ඇ) ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ පළමු අදියරේ සියයට 5 ක් එකතු කරන ලද රක්ෂණ වියදම වූ රු. 19,986 ක් ගෙවීම නොකර ඉංජිනේරු ඇස්තමේන්තුවේ වෙන් කරන ලද රු. 29,020 ක මුළු මුදලම ගෙවීම් කිරීම හේතුවෙන් රු. 9,034 ක අධි ගෙවීමක් නිරීක්ෂණය විය. | මිල සහ ප්‍රමාණ පත්‍රයේ ගෙවීම් ක්‍රමය යටතේ දැක්වෙන කොන්දේසි අනුව රක්ෂණය සඳහා වන වියදම ප්‍රතිපූරණය කළ යුතුය. | රැඳවුම් මුදල්වලින් නිවැරදි කිරීම් කරමි. |
| (ඇ) ගොඩනැගිල්ල පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිළධාරියෙකු සේවයේ යෙදවීම් වෙනුවෙන් මාස 04 ක් සඳහා රු. 32,000 ක අධි ගෙවීමක් නිරීක්ෂණය විය. | අධි ගෙවීම් නැවත අය කළ යුතුය. | රැඳවුම් මුදල්වලින් නිවැරදි කිරීම් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ගොඩනැගිල්ල පිටුපසින් තවත් කොටසක් එක් කිරීමට Slab හා Beam වලට කම්බි විවෘතව තබා තිබුණු අතර එහි කම්බි මළ කා විනාශ වීමේ අවධානමක් පැවතුණි. | රාජ්‍ය මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් හා වගකීමකින්/ඵලදායිත්වයකින් යුතුව කළමණාකරනය කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම්තුමාගේ ඉල්ලීම මත වෙනස් කර ඇත. |
| (ඊ) | ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ඉදිකිරීම්වලට අදාළව සැලසුම්වල ඇතුලත් පරිදි ගොඩනැගිල්ලේ දික් Beam සඳහා 10mm කම්බි යෙදීම වෙනුවෙන් රු. 19,840ක මුදලක් ගෙවා තිබූ නමුදු, Beam සඳහා 10mm කම්බි යොදා නොතිබූ බව මේ සම්බන්ධයෙන් සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | අධි ගෙවීම් නැවත අය කළ යුතුය. | අවසන් ගෙවීමේදී නිවැරදි කරමි. |
| (උ) | ඉදි කිරීම් කටයුතු සඳහා පළමු හා දෙවන අදියර වැඩ වලට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේ දී වැඩ අයිතම අංක A1, A2, A3, A4, A5, A6, A7 සහ A8, සඳහා වන පිරිවැය ගණනය කිරීමට නිශ්චිත හා ඒකාකාරී පදනමක් අනුගමනය කර නොතිබුණි. ඒ අනුව, රක්ෂණය, කාර්ය සාධන සුරක්ෂණය, තාවකාලික ගොඩනැගිලි ඉදිකිරීම, ජල හා විදුලිය සහ තාක්ෂණ නිලධාරීන් සඳහා වන වියදම යනාදී වියදම් සඳහා ඇස්තමේන්තුගත වටිනාකම ගණනය කිරීමේ පදනම විගණනයේදී පැහැදිලි නොකෙරුණි. | මිල රේටයන් සම්බන්ධයෙන් ඒකාකාරී පදනමක් අනුගමනය කළ යුතුය. | නැවත ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙම වැරදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ඔක්තෝබර් 10 දින රු. 12,956,898 ක වියදමින් ඉදිකිරීම් අවසන් කර තිබුණු ඕමන්ත ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් විගණනය සිදු කළ 2020 ජුලි 10 දින වන විටත් මහජන භාවිතය සඳහා විවෘත කර නොතිබූ අතර, මධ්‍යස්ථාන භූමිය වල් බිහි වී පැවතුනි. ඒ අනුව, මෙම ගොඩනැගිල්ල වසරකුත් මාස 09 ක පමණ කාලයක් නිශ්කාර්යයව පැවති බව නිරීක්ෂණය විය. | ගොඩනැගිල්ල හා භූමිය භාවිතයට සුදුසු ලෙස සකස් කර මහජනයා සඳහා විවෘත කිරීමට කටයුතු කළ යුතුය. | විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වවුනියා උතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන ඇප තැබිය යුතු නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880(1) ප්‍රකාරව ඇප තැබිය යුතුය. | ඇප මුදල් ලබා ගැනීමට පියවර ගනිමි. |

### 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක NNP2/VN/A/K/2019/04 හා 2019 දෙසැම්බර් 06 දිනැති විගණන විමසුම සඳහා පිළිතුරු ලබාදී තිබුණේ 2020 මැයි 13 වන දින දීය. | විගණන විමසුම් සඳහා නොපමාව පිළිතුරු සැපයිය යුතුය. | පිළිගනිමි. |

### 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාවට නංවා තිබුණු ඉරට්ටපෙරියකුලම ගම්මානයේ ඉඩම් නොමැති වූවන් සඳහා රජයේ ඉඩම් ලබා දීම වැඩ සටහන යටතේ 2014 වර්ෂයේ 57 දෙනෙකු සඳහා පර්චස් 80 බැගින් බිම් කොටස් ලබා දී තිබුණ අතර, විගණනය සිදුකළ 2019 අගෝස්තු 05 දින වන විට බිම් කොටස් බෙදා දී වසර 05ක පමණ කාලයක් ගත වී තිබුණද බිම් කොටස් 57 න් 08 ක පමණක් ඉඩම් සංවර්ධනය කර නිවාස ඉදි කර පදිංචි වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ අවසන් කාර්යය සාධනය ඉටු කර ගැනීමේ ප්‍රගතිය සියයට 14 ක පහළ මට්ටමක පැවතුණි. | ව්‍යාපෘතියේ අවසන් කාර්යය සාධනය ඉටු කර ගැනීමට කළනාකරණය කටයුතු කළ යුතුය. | පදිංචිවී නොමැති ඉඩම් සොයා බලා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේදී ක්‍රියාවට නංවා තිබුණ ඉරට්ටපෙරියකුලම වේරගම රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය මඟින් රජයේ සේවකයින් 113 දෙනෙකු වෙත පර්චස් 40 බැගින් බිම් කොටස් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනය සිදුකළ 2019 අගෝස්තු 05 දින වන විට වසර 08 ක පමණ කාලයක් ගත වී තිබුණද, එම ඉඩම් කැබලි 113 න් ඉඩම් කැබලි 45 ක පමණක් නිවාස ඉදිකර පදිංචි වී තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 40 ක් වැනි පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කර අදාළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | පදිංචිවී නොමැති ඉඩම් සොයා බලා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරමි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| පුරප්පාඩු 84 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් ලේකම්ට බලය නොමැති අතර මේ පිළිබඳව අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුව ඇත. |